
# 3023 නයිජර්



රනුමි සෙහන්සා දිසානායක

3023 නයිජර්

රනුමි සෙහන්සා දිසානායක

8 ශ්‍රේණිය

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

කතෘ ප්‍රකාශන

ISBN No. 978-206-649-3

කතෘගේ වෙනත් කෘති

සිගිතිගේ ලේන් කූඩුව - 2019

මලී - 2020

ප්‍රථම මුද්‍රණය - 2023 නොවැම්බර් මස 15 දින.

# පිදුම

අප විද්‍යාලයේ වර්තමාන විදුහල්පතිතුමිය ශෂිකලා

සේනාධීර මහත්මිය ඇතුලු විද්‍යාලයේ ගුරු

මැණිවරුන්ට හා පියවරුන්ට,

මෙම ව්‍යාපෘතියේ මූලීකත්වය ගෙන කටයුතු කරන

සෙනෙවිරත්න මහත්මාට,

මාගේ දෙමව්පියන්ට හා උදව් කල සියලු දෙනාට

හද බැතියෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි  එසේ නම් පාසලට වගකම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින්  ගොලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමකිරීමේ ප්‍රතඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණන් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අතද් ැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතවු න වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක 'ලියන්නට සිහින දකනි දරුවන් සහෝදරතව්යෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අතද්කීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තයික් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමකු විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යොජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක්වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා  සේනාධීර

විදුහල් පතනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



2023.10.20

# 3023 නයිජර්

හායි ! යාළුවේ මම 3023 වසරේ ජීවත් වන ළමයෙක්මි. මගේ නම නයිජර් මට දැනට වයස අවුරුදු 12 යි. මට අම්මා විතරයි ඉන්නේ. මගේ තාත්තා මෙළොවින් සමුගෙන  අදට හරියටම අවුරුද්දක් වෙනවා. එතකොට එයාගේ වයස  අවුරුදු 40 යි. ඇයි දන්නවද මගේ තාත්තා එච්චර අඩු වයසකින් මිය ගියේ? 3023 වසරේ මනුෂ්‍ය පරමායුෂ අවුරුදු 40 ත් 45 ත් අතරයි, ඊට එහා වයසකින් කවුරුවත්  ජීවත් වෙන්නේ නෑ. අපගේ ශරීරයත් ප්‍රමාණයත් කුඩයි.


අම්මයි මමයි ජීවත් වෙන්නේ  තට්ටු 425 ක් ඇති මහල් සංකීර්ණයේ 308 වෙනි තට්ටුවේ ය. අපේගෙදර අධිතාක්ෂණික උපකරණ වලින් යුක්තකි. එහි පහළම මාලයේ තියෙනවා අධි තාක්ෂණික උපකරණ වලින් යුක්ත පාසලක්.  ආ.... මට කියන්න බැරි වුනාණේ අපේ ගෙදර අම්මටයි මටයි අමතරව තව කෙනෙක් ඉන්නවා. එයා අපේ ගෙදර වැඩ වලට ගොඩාක් උදව් කරනවා. එයා තමයි  '' රොබෝ නැනී'' එයා AI තාක්ෂණයෙන් යුක්ත වූවෙකි. මගේ උදෑසන පවිත්‍රතාවයේ සිට නිදා ගැනීම දක්වා සියලුම වැඩ කරන්නේ රොබෝ නැනී

විසිනි. ඒ අනුව කොටින්ම කිව්වොත් මගේ දින චර්යාව ගතවෙන්නේ රොබෝ නැනීට අනුවයි.





අපේ රටේ සියලු දෙනාගේම දවස ආරම්භ වන්නේ සවස 5.00 ට පමණ ඉර බැස යාමත් සමග ය. දිවා කාලයේ මුළු පෘථිවි තලයම උණුසුමෙන් රත් වෙනවා හරියට ඉරවල් දෙකක් පායලා වගේ. දැඩි හිරු රශ්මියෙන් බේරීමට එළියට නොගොස් වායු සමීකරණය කරන ලද නිවෙස් වල නිදා ගන්නවා. ඒ නිසා තමයි දවසේ වැඩ කටයුතු ආරම්භ වෙන්නේ සවස් කාලයේ සිටයි.

නිවෙස් වලින් පිටතට යනවිට අධික හිරු රශ්මියෙන් බේරීමට විශේෂ ඇඳුම් කට්ටලයකින් සැරසිය යුතුමයි. ඒවා හරියට ගගනගාමීන්ගේ ඇඳුම් කට්ටලයට සමානයි. රාත්‍රි කාලයේදි පරිසරයේ උෂ්ණත්වය අඩුවන අතර $O_2$ සහිත සිලින්ඩරයක් හැම පුද්ගලයෙක් සතුවම තිබිය යුතුයි. 3023 වර්ෂයේදි ගස්කොළන්ද විනාශ වී ඇති අතර, කිසිදු ගහක් කොළක් පෘථිවියේ නැති තරමය. ඇළ දොළ, ගංගා ද සිඳි ගොස් තුරන් වී ඇති හෙයින් පරිසරයේ උෂ්ණත්වය වැඩි වීමද වායු ගෝලයේ පිරිසිදු වාතය නැති වීමද නිසා මෙලෙස සෑම පුද්ගලයෙකු ලඟම $O_2$ ටැංකි තබා ගැනීම අනිවාර්ය වේ. $O_2$ ඉවර වූ විට $O_2$ පිරවුම් හලකට ගොස් මුදල්ගෙවා $O_2$ ටැංකි වලට පුරවා ගත යුතුය.



යාළුවේ, ඔයාලා හිතන්නේ අපි මොනවා ආහාරයට ගන්නවා කියලද ? අපි අපේ ප්‍රධාන ආහාරය හැටියට කන්නේ අධි පෝෂණය සහිත  චොක්ලට් වර්ග . සමහර ඒවා කඩේ ගන්නත් තියෙනවා. ඒත් අපේ ගෙදරනම් රොබෝ නැනී තමයි හදන්නේ. එයින් චොකලට් පෙත්තක් ආහාරයට ගත් විට දිනකට අවශ්‍ය පෝෂණය එයින් සපුරා ගත හැක.

තවද මීට අවුරුදු 1000 කට පෙර ලෝකයේ තිබු යැයි කියන ලද එළවළු, ධාන්‍ය වර්ග, පලාවර්ග 3023 වර්ෂයේ නොමැත. චොකලට් වර්ග වලට අමතරව අධි පෝෂණය සහිත බිස්කට් වර්ග ආහාර වශයෙන් ඇත.




'' නයිජර් නයිජර් නැගිටින්න ඉස්කෝලේ යන්න තියෙනවා නේද ? හොඳටම ඉර බැහැලා තියෙන්නේ '' අම්මා කීවාය.

''හරි අම්මේ නැගිටින්නම්'' නයිජර් කීවේ ය.

අපිට ජලය නැති නිසා පිරිසිදු කරගැනීමේ කටයුතු සිදු කරන්නේ ඩ්‍රයි ක්ලීන් ($Dry\ clean$) භාවිතයෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීම ආදී සියලුම දේ සිදුකරන්නේ නැනීගේ උපකාරයෙනි.

ඉහත කියු පරිදි නැනී මගේ ඇඳුම්ද, ඔක්සිජන් ටැංකිය සහිත ඇඳුම් කට්ටලයද මට ඇන්දුවාය. ටික වේලාවකට


පසු නයිජර් තම නිවස තුළ ඇති විදුලි සෝපානය භාවිතයෙන් මහල් සංකීර්ණයේ පහත මාලයට ගියේ ය.

ඔහු පහත මාලයට ගොස් එම දොරෙන් පිවිසීමට යන විටදී රොබෝවරයෙක් පැමිණ ඔහුව ස්කෑන් කර බලා ඇතුළට යැව්වේ ය.

මෙසේ පාසලට පැමිණෙන සෑම ළමයෙක්ගේම සෞඛ්‍ය තත්වය ස්කෑන් කර බලයි. එයට හේතුව වෛරස, බැක්ටීරියා වැනි බෝවන රෝග වලින් අනෙක් අය ආරක්ෂා කිරීමත් බෝනොවන රෝග වලින් එම පුද්ගලයාව ආරක්ෂා කිරීමත් ය.

පාසලේ කිසිදු ළමයෙක් තව ළමයෙක් සමග කතා නොකරයි. එසේ තව ළමයෙක් සමග කතා කිරීමට කිසිදු වේලාවක් නැත. එසේ තමන්ගේ පන්ති කාමරයට ගියපසු තමන්ගේ ලැප්ටොප් යන්ත්‍රය භාවිතයෙන් ඉගෙනුම් ඉගැන්වීම් සිදු කරයි. තවද ඒවාට රොබෝ ගුරුවරුන් උපකාරි වෙයි. ළමයින් වෙන ළමයෙකු ගැන කිසිදු හැඟීමක් හෝ තැකීමක් නැත.  ඔවුන් එක දිගට තමන්ගේ ලැප්ටොප් යන්ත්‍රය දෙස බලා ඉගෙන ගනියි. එවිට ළමයින් සිටින්නේ හරියට රොබෝවරුන් ලෙසටය.

තවද ඔවුන් පාසලේ ඉගෙන ගන්නේ පැය 4 ක් පමණි. ඉන්පසු සැවොම තමන්ගේ ඩ්‍රෝන් යානයට නැගී තමන්ගේ රැකියාව ඇති ප්‍රදේශයට යති.




පාසලේ සිටින්නේ අවුරුදු 5-15 ත් අතර සිසුන්ය. තවද රැකියා කිරීමට ඉඩ ලබාදෙන්නේ අවුරුදු 10 ට වැඩි ළමයින්ට පමණි.

මෙසේ ලොකු වාහන තදබදයක් ඇති වන නිසා වැඩිපුර ගමන් යන්නේ ඩ්‍රෝන් යානා මගින්ය.

උදේ 8.00 පමණ වන විට නයිජර් තම ඩ්‍රොන් යානය සමග මහල් සංකීර්ණය වෙත පැමිණියේ ය.

සෑම ඩ්‍රෝන් යානයක්ම විදුලි බලයෙන් ක්‍රියාත්මක වේ. 3023 වසරේදි විදුලි ශක්තිය කිසි විටකදී නිම නොවන බැවින් ඔවුන්ට ඕනෑම වේලාවකදී ඩ්‍රොන් යානය මගින් පියාසර විය හැකිය.



පසුවදා නයිජර් සවස 5.00 ට පමණ නිවසින් පිටත් වූ අතර, නයිජර් එදින පමා නොවී රස්සාව සිදු කරන ප්‍රදේශයට ගියේ ය.

නයිජර් ළමා අවධිය නොතකා මහන්සි වුණේ ය. ඔහු ඉතා දක්ෂ නව නිපැයුම්කරුවෙකි. ඔහු රොබෝ තාක්ෂණය කෙරෙහි විශේෂ ඇල්මක් දැක්වූ අතර ස්පාර්ක් නම් ඔහුගේ රොබෝ සහකාරියක් නිර්මාණය කර තිබුණා.


නයිජර් සහ ස්පාර්ක් නගර ගවේෂණය කිරීම, ලෝකය ගැන ඉගෙනගැනීම සහ  නව උපාංග සොයාගැනීම සඳහා ඔවුන්ගේ දින ගත කරනු ඇත.

දිනක් නයිජර් ඔහුගේ සහකාරිය වන ස්පාර්ක් සමග පැණි අතහැර දැමූ ගොඩනැගිල්ලක් ගවේෂණය කරමින් සිටියදී අමුතු උපකරණයක් සොයා ගත්තේ ය. එය කාලය පාලනය කළහැකි උපකරණයක් විය. මෙම නවතම බලය සමග නයිජර් සහ ස්පාර්ක් වික්‍රමාන්විතයක් ආරම්භ කළ අතර විවිධ යුග වලට ගමන් කරමින් කාල චාරිකාවේ උද්යෝගය රස වින්දේය.

එක් දිනක් ඔහු 2023 ලෝකයටද කාල යාත්‍රාව මඟින් පිවිසියේ ය. ඔහු ජීවිත කාලය තුල නොදුටු ගස් වැල්, ඇළ දොළ, ගංගා හා පරිසරයේ සුන්දරත්වය දැක අප්‍රමාණ විශ්මයටත්, සතුටටත් පත් විය.

නමුදු දැන් ඔහු ජීවත් වන ලෝකයට සිදුවී තිබෙන්නා වූ විපර්යාසය දැක ඔහු ඉතා දුකටත් කලකිරීමටත් පත් විය. තමන්ගේ ලෝකයද ඒ අයුරින් නම්වාලීමට සිදුකර යුත්තේ කුමක්දැයි දිගින් දිගටම සිතන්නීය.

නව නිපැයුම්කරුවෙකු වූ නිසා ශාක වැවීම කෙරෙහි අවධානය යොමු කරමින් එහි වැදගත්කම ලොවට කියාපාමින් 3023 ලෝකය හැඩගැස්වීමට කටයුතු ආරම්භ කළේ ය. ඉතින් නයිජර් ස්පාර්ක් සමග ඔහුගේ වික්‍රමාන්විතයන් දිගටම කරගෙන ගියේ ය. ඔහු අතීතය පිළිබඳ ඔහුගේ දැනුම අනාගතය වඩාත් යහපත් කිරීමට භාවිත කළ අතර නගරයේ සෑම කෙනෙකුටම උපකාරි වන තාක්ෂණයක් සොයා ගත්තේ ය. ඔහුගේ නව නිපැයුම් ඔහුගේ ප්‍රජාව තුළ වීරයකු බවට පත්වුණ නමුත් නයිජර් සෑම විටම නිහතමානීව සිටියේ ය. ඔහුගේ සැබෑ විපාකය සොයා ගැනීමේ ප්‍රීතිය සහ නව නිපැයුම් වල ත්‍රාසය බව දැන සිටියේ ය. නයිජර් ඔහුගේ දීප්තිමත් මනසින් 3023 ලෝකය හැඩ ගැස්වීම සිදු කළේ ය.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ස්‍යූපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

**2023.10.20**